# සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය

**විල්ගමුවේ පියනන්ද හිමි**

## හැඳින්වීම

"කාව්‍ය ශාස්ත්‍ර විනෝදේන - කාලො ගච්ඡති ධීමතාම්
ව්‍යසනේනච මූර්ඛාණාම් - නිද්‍රයා කලහේනවා"[1]

නැණවතුන්ගේ කාලය කාව්‍ය ශාස්ත්‍ර පරිශීලනයෙන් ලබන වින්දනයෙන් හෙවත් සෞන්දර්ය රස වින්දනයෙන් යුක්තව ගෙවී යයි. අඥානයන්ගේ කාලය කෝලාහල කිරීමෙන් හා නිදීමෙන් මෙන්ම ප්‍රලාප දෙඩීමෙන් හා සූදු කෙළීම් ආදී ව්‍යසන ක්‍රියාවන්ගෙන් ගෙවීයන බව මෙම සංස්කෘත ශ්ලෝකයෙන් ප්‍රකාශ වේ. සෞන්දර්ය රසාස්වාය ශ්‍රව්‍ය හා දෘශ්‍ය යන අංශ දෙකින් යුක්තය. බුදුදහම එම සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ දක්වන ආකල්පය අධ්‍යයනය කිරීම මෙමගින් අපේක්ෂිතය.

සෞන්දර්ය යනු සුන්දරත්වය හෙවත් සිත් ඇද ගන්නා රමණීයත්ත්වයයි. මෙය ස්වභාව ධර්මය තුළින්



නිරායාසයෙන් සෑම පුද්ගලයෙකුටම ලබා දෙයි. එයට අමතරව යම් කිසි කලාවක සෞන්දර්ය යැයි නම් කරන්නේ එහි ඇති සෞන්දර්යාත්මක ගුණාංගවලට ය. එම ගුණාංගයන් ශ්‍රව්‍ය හා දෘශ්‍ය වශයෙන් දෙයාකාරයකින් අපට අත්විඳිය හැකිය. එමගින් වින්දනයක් ඇති වන අතර එම වින්දනය එකහෙලාම බලපාන්නේ අපේ සිතටය. එනිසාම කලාකෘතියක් අත්විඳීමෙන් ඇතිවන සිත කිතිකවන සුළු ප්‍රීති ප්‍රමෝදය සෞන්දර්ය රසාස්වාදය නම් වේ. එසේම රසාස්වාදය සෑම විටම මනෝමූල ආනුභාවයක් විනා ඉන්ද්‍රියමූල අර්ථකථනයක් නොවනු ඇත. සෞන්දර්ය රාසාස්වාදය අත්විඳීමෙන් සෑම පුද්ගලයෙක්ම එහි රසිකයෙක් බවට පත්වීමෙන් ඒ බව තව දුරටත් තහවුරු වේ.

කලා කෘතියකින් පුද්ගලයෙකු රසිකයෙකු බවට පත්කිරීමට නම් එම කලාකෘතියෙහි ආනන්දජනක ගුණාංගයන් ස්ථායිභාව අනුව සමබරව යෙදිය යුතු වෙයි. ස්ථායිභාව නමයක් පුරාණ කාව්‍ය ශාස්ත්‍රඥයන් විසින් දක්වා ඇති අතර ඒ අනුව රස උත්පාදනය දක්වා ඇත.

| ස්ථායිභාව | උපදින රස |
|---|---|
| 01. රති | ශෘංගාරය |
| 02. හාස | හාස්‍ය |
| 03. ශෝක | කරුණා |
| 04. ක්‍රෝධ | රෞද්‍ර |
| 05. උත්සහ | වීර |
| 06. භය | භයානක |
| 07. ජුගුප්සා | බීභත්ස |
| 08. විස්මය | අද්භූත |

09. ශම ශාන්ත[2]

මෙයට අමතරව වත්සල, සද්ධා, මෛත්‍රී ආදී තවත් රස කිහිපයක් ඇති බව සාහිත්‍ය විචාරකයන්ගේ මතයයි. මෙම රස මිනිස් සිතෙහි ඉහත සඳහන් පරිදි ස්ථායිභාව අනුව ඇති වේ. එවිට රස නිෂ්පත්තිය සිදුවන අතර එය සෞන්දර්ය නම් වේ.

## සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය

මිනිසා ජීවත් වන ලෝකය දුක මත පිහිටා ඇත. (දුක්ඛෙ ලොකො පතිට්ඨිතො) බුදුදහමට අනුව නිර්වාණය හැර (නිබ්බාණං පරමං සුඛං) සුන්දරයැයි කියා වින්දනය කරණු ලබන සෙසු සියලුම දේ තාවකාලික සතුට පිණිස පවතු ඇත.[03] ලොකයේ ඇති සුන්දර හා අසුන්දර සෑම වස්තුවකම ස්වභාවය වන්නේ උත්පාද, ඨිති, භංග යන ලක්ෂණත්‍රයෙන් සමන්විත ව අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණත්‍රයට භාජනය වීමයි. එබැවින් දුක මත පිහිටි ලෝකයේ යථා ස්වරූපය අවබෝධ කරවීම බුදුදහමේ මූලික අපේක්ෂාවයි. එහෙත් ලෞකික ජීවිතයේ දී මිනිසා සුන්දර දෙයට ඇලුම් කිරීම ස්වභාවිකය. එය ධාර්මික ලෙස වින්දනය කිරිම පිණිසත් එම වින්දනය ආධ්‍යාත්මික ප්‍රීතය නම් අවේදයිත සුඛය බවට පරිවර්තනය කරගැනීම පිණිසත් අවශ්‍ය උපදෙස් මජ්ඣිමනිකායේ මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රයෙහි දක්වා ඇත.[4]



බුදුදහම ආධ්‍යාත්මික විමුක්තිය සඳහා පමණක් උපදෙස් දෙන සර්ව අසුභවාදි දර්ශනයක් ඉදිරිපත් කරන දහමක් බව ලෝකයේ ඇතැම් උගතුන්ගේ මතයයි. එබැවින් ලෞකික විෂයානු බද්ධ සෞන්දර්ය රසාස්වාදය පිණිස බුදුදහමින් ඉඩක් නොලැබෙන බව ඔවුන්ගේ අදහසයි. එය සපුරා වැරදි මතයකි. සැබෑ වු සෞන්දර්ය යනු මිනිස් මනසේ යථාර්ථවාදී සිතුවිලි අවදිකිරීමකි. බුදුදහමේ ද මූලික ඉගැන්වීමක් වන පටිච්චසමුප්පාදය තුළින් සිදු කොට ඇත්තේ ලෝකයෙහි ඇති සැබෑ වූ තත්ත්වය යථාර්ථවාදිව දේශනා කිරීම ය. සුන්දර යැයි ලාමක පුරුෂයන් විසින් ඇලෙන ලද බොළඳ රාගික වූ ද ශෘංගාරාත්මක වූ ද විඳීම් හා ආශ්වාදයන් බුදුදහමින් ප්‍රතික්ෂේප වන අතර ඇලීමෙන් තොරව සෞන්දර්ය රසාස්වාදය මඟින් අත්විදින ධාර්මික ප්‍රීති සුවය බුදුදහමෙන් අගය කරණු ලබයි. සෞන්දර්ය මඟින් ජනයා මුසපත් කිරීම බුදුදහමින් ප්‍රතික්ෂේපිතය. එනිසා ම බෞද්ධ පඬිවරුන් බෞද්ධ කලාවේ සෞන්දර්යාත්මක පරමාර්ථ ලෙස දක්වා ඇත්තේ ප්‍රසාදය හා සංවේගය පමණි.

## ස්වභාව සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය

බුදුන් වහන්සේ ස්වභාව සෞන්දර්ය මැනවින් අගය කළා සේම ස්වභාව සෞන්දර්යෙහි ජීවත් වු ශාස්තෘවරයෙක් වෙති. උන්වහන්සේගේ ඉපදීම සිදුවූයේ සුන්දර ලුම්බිණි සාලවනෝද්‍යානයෙහි ය. වයස විසිනමයෙන් ගිහිගෙයින් නික්මී සත්‍ය ගවේෂණය කළ බෝසත් අවධියෙහි ඒ සඳහා උන්වහන්සේ විසින් තෝරාගෙන අත්තේ ඉතා සිත්කළු

රමණීය වූ භූමි භාගයකි. ඒ බව "රමණීයො වත භූමිභාගො, පාසාදිකො ච වනසණ්ඩො, නදී ච සන්දති සෙතකා සුපතිත්‍ථා රමණීයා"[5] යනුවෙන් මජ්ඣිමනිකායේ අරියපරියේසන සූත්‍රයේ සඳහන්ව ඇත. අනතුරුව උතුම් බුද්ධත්වය එහි වූ ඇසතු රුකක් මුල දී ලැබ ප්‍රථම ධර්ම දේශනය ද පැවැත්වීම සඳහා තෝරා ගන්නා ලද්දේ පස්වග තවුසන් විසින් සේවනය කරන ලද මුවන්ට වාසභූමිය වූ රමණීය ඉසිපතන මිගදායයි. කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ උපවර්තන සාලවනෝද්‍යානයෙහි දී වයස අවරුදු අසූවේ දී උන්වහන්සේගේ පිරිනිවන් පෑම සිදුවන තෙක් බුද්ධ චරිතයේ වැඩි කාලයක් ගෙවී ඇත්තේ පරිසරය ඇසුරු කොට ගෙනය. එබැවින් ම බුදුන් වහන්සේ විසින් පරිසර සෞන්දර්ය අගය කළ බවට සාධක රැසක් ත්‍රිපිටකයේ අන්තර්ගත ය.

"ගාමෙවා යදිවා රඤ්ඤෙ - නින්නෙවා යදිවා ථලෙ
යත්‍ථ අරහන්තො විහරන්ති - තං භූමිං රාමණෙය්‍යකං" [6]

ගමෙහි හෝ වනයෙහි හෝ ගොඩ බිමෙහි හෝ රහතන් වහන්සේලා වෙසෙයිත් නම් ඒ භූමිය රමණීය වූ භූමියක් වන බව මෙහි තේරුමයි. එහි වීතරාගී උතුමන් විසින් වින්දනය කරණු ලබන රමණීයත්වය භෞතික ලෝකයේ සෞන්දර්ය රසවිඳීම ඉක්මවා ගිය සෞන්දර්ය රසාස්වාදයේ ඉහළම තලයක් ලෙස හැඳින් විය හැකි ය. කාමභෝගී ගිහියන් විසින් ඇලුම් නොකරන සිත් කළු වනයෙහි



සුන්දරත්වයට වීතරාගී උතුමන් වූ රහතන් වහන්සේලා ඇලුම් කරන බව මෙම ගාථාවෙන් පැහැදිලි වේ.

"රමණීයානි අරඤ්ඤානි - යත්‍ථ න රමතී ජනො
වීතරාගා රමෙස්සන්ති - න තෙ කාමගවේසිනො"[7]

පරිසර සෞන්දර්ය රසවිඳීම බුද්ධ චරිතයෙන්ම මැනවින් පැහැදිලිවන අවස්ථාවක් ලෙස දීඝනිකායේ මහාපරිනිබ්බාණ සූත්‍රය දැක්විය හැකිය.

"රමණීයං ආනන්ද වෙසාලී, රමණීයං උදෙන චෙතියං, රමණීයං ගොතමක චෙතියං, රමණීයං සත්තම්බ චෙතියං, රමණීයං බහුපුත්තං චෙතියං රමණීයං සාරන්දදං චෙතියං, රමණීයං චාපාලං චෙතියං"[8]

එම චෛත්‍ය පිහිටි ස්ථාන වන විසල් පුරය, උදේන, ගෝතමක, බහුපුත්තක, සාරාන්ද, චාපාල යන ස්ථාන රමණීය වූ, සිත්කළු වූ, චිත්තාකර්ෂණීය වූ ස්ථාන ලෙස වර්ණනා කොට ඇත. එසේම ථෙර, ථෙරී ගාථාවන්හි මෙන් ම ජාතක පාළියෙහි ඉතා අලංකාර පරිසර වර්ණනා තිබේ. ථෙර ගාථා පාළියේ සඳහන් කාළුදායි තෙරුන් වහන්සේ විසින් කරන ලද පරිසර වර්ණාව බුදුන් වහන්සේ ඉදිරිපිට කරන ලද්දකි. සුදෝවුන් රජු විසින් තම පුත් සිද්ධාර්ථ බුදු වූ බව අසා ඉමහත් ප්‍රීතියෙන් යුක්තව ගෞතමයන් වහන්සේ කිඹුල්වත් නුවරට ගෙන්වා ගෙන ඒම සඳහා පිරිස යවන ලදී. එම ගිහි සියලු දෙනා බුදුන් වහන්සේ ළඟ පැවිදි බව ලැබ එහිම නතර විය. සුදොවුන් රජු තම බුදුපුත් දැකීමේ උත්සාහය එයින් ද නතර නොකළ අතර කාළුදායි ඇමතියා සහ දහසක් පිරිස සහිතව බුදුන් වහන්සේ වැඩමවාගෙන ඒම සඳහා එම පිරිසට පැවිදිවීමේ අවසරය ද ලබාදී පිටත් කර යැවූ බව බෞද්ධ

සහිත්‍යයේ සඳහන් ය. මෙහිදී කාළුදායි ඇමතියා පැවිදිව රහත්බව ලැබ බුදුන් වහන්සේ ඉදිරියෙහි බැඳගිලිව කිඹුල්වත ඇති ස්වභාව අසිරිය සිත්ගන්නා ලෙස දැක්වීමෙන් අනතුරුව බුදුන් වහන්සේට එහි වඩින ලෙස ආරාධනා කරන විස්තරය ඉතා ළගන්නා පරිසර වර්ණනාවකින් සිදු කොට ඇත. බුදුන් වහන්සේ ද එම ආරාධනාව පිළිගන්නේ එම කාලය පසුවුවහොත් එබඳු කාලයක් යළි පැමිණීමට වසරක් ගතවන බව දන්නා නිසාය.

''අංගාරිනො දානි දුමා හදන්තෙ - ඵලෙසිනො ඡදනං විප්පහාය
තෙ අච්චිමන්තො ව පභාසයන්ති - සමයො මහාවීර භගීරසානං''

''දුමානි ඵුල්ලානි මනොරමානි - සමන්තතො සබ්බ දිසා පවන්ති
පත්තං පහාය ඵලමාසමානා - කාලො ඉතො පක්කමනාය වීර''

''නෙවාති සීතං න පනාතිඋණ්හං - සුඛො උතු අද්ධනියා හදන්තෙ
පස්සන්තු තං සාකියා කොලියා ච - පච්ඡමුඛං රොහිණියං තරන්තං''[9]

ඵල අපේක්ෂාවෙන් පත්‍ර හැලී ඇති ඇතැම් ගස් ඇතට දිස්වන්නේ ගිනි අඟුරු මෙනි. එහිම ඇතැම් ගස් ගිනි සිළු මෙන් ප්‍රභාස්වරය. මෙය සියළු රසයන් එකට එක්වූ කාලයකි.

සමහර ගස් සිත්කළු ලෙස පත්‍ර හැලී මල් පිපි ඇත. එසේ මල් පිපී ඇත්තේ ඵල අපේක්ෂාවෙන්ය. හාත්පස සුගන්ධවත් වි ඇත. වීරයන්වහන්ස, මෙයින් නික්ම ගමරට බලා යෑමට කාලයයි.



උෟෂ්ණයෙහි හෝ සීතලෙහි අඩුවක් හෝ වැඩියක් නැත. වසරක මෙතරම් හොඳ දේශගුණ කාලයක් තවත් නොලැබේ. ශාක්‍යයෝ ද කොලියෝ ද රෝහිණී නදිය දෙපසට වී ඔබ වහන්සේ වඩින තෙක් බලා සිටිති. ඉරට පිටුපා රෝහිණී නදිය තරණය කරනු මැනවි. යනුවෙන් කිඹුල්වත් නුවර සහ ඒ සඳහා ප්‍රවිෂ්ට වන ප්‍රවේෂ මාර්ගයෙහි වූ අසරිය ඉතා චමත්කාර ජනක සෞන්දර්ය වර්ණනාවකින් කාළුදායි තෙරුණ් වහන්සේ විසින් ඉදිරිපත් කොට ඇත. බුදුන් වහන්සේ ද එම ආරාධනය පිළිගෙන විසිදහසක් භික්‍ෂු සංඝයා පිරිවරා මැදින් පුර පසළොස්වක් පොහොය දිනයෙහි කිඹුල්වත බලා වැඩම වූ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වේ.

බෞද්ධ සාහිත්‍යය විමුක්ති රසභාවයෙන් යුක්ත වනවාක් සේම සාහිත්‍ය රසභාවයෙන් ද අනූන වෙයි. ඒ බව තව දුරටත් තහවුරු කරන වීතරාගී ස්වභාව සෞන්දර්ය වර්ණනා ථෙර, ථෙරි ගාථාවන්හි හමුවේ. රහතන් වහන්සේලා විසින් කරන ලද එම වර්ණනා භාරතීය සාහිත්‍යයේ ඇති ලෞකික සෞන්දර්ය වර්ණනා ඉක්මවා පවතින බවට සප්පක තෙරුන් විසින් වර්ණිත මෙම පරිස වර්ණනය දැක්විය හැකිය.

''යදා බලාකා සුචිපණ්ඩරච්ඡදා - කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා
පලෙහිති ආලයමාලයෙසිනී - තදා නදී අජකරණී රමෙති මං'' [10]

වැසිබර අවස්ථාවක මහවනයෙහි අජකරණී නදිය අසබඩ තනිව වැඩහුන් සප්පක තෙරුන් වහන්සේ දුටු

සිත්කළු දර්ශනය පද්‍යයට මෙලෙසින් නඟා ඇත. මෙය එම අවස්ථාවෙහි සප්පක තෙරුන්ගේ සිතට නැගි නිරායාස හැඟීමක් බව පැහැදිලි ය. සිත්කළු අජකරණී නදිය අසබඩ හුන් එම හිමියන්ට වැහිබර මොහොතෙහි කෑම සොයා ගඟ හරහා සුදුපැහැ පියාපත් දිගහැර පියඹායන කොකුන් පෙළත්, නදියෙහි සිත්කළු බවත්, එම අවස්ථාවෙහි වූ වැහිබර අහස් කුසත් දැකීම සිත ප්‍රීතිප්‍රමෝදයට පත්කරන දර්ශනයක් විය. මෙවැනි සෞන්දර්යාත්මක පරිසර වර්ණනා ත්‍රිපිටකයෙහි සුලබය.

## ගීතය හා කවිය පිළිබඳ බෞද්ධ ආකල්පය

සෞන්දර්ය රසාස්වාදය පිරි තවත් විෂයක් වන්නේ ගීතය හා කවියයි. බුදුසමය පුද්ගලයාගේ සංසාරික ජීවිතය අතෘප්ති කර වූ දෙයක් ලෙස දක්වමින් එයින් මිදීම පිණිස විමුක්ති මාර්ගය නිර්දේශ කොට ඇත. එහෙත් මිනිසුන්ගේ සමාන්‍ය ජීවිතයෙහි ජීවන පැවැත්ම පිණිස හේතුවන ලෞකික සංතුෂ්ටිය හෙලා දැකීමක් සිදු කොට නොමැති බව මෙහි දි අපගේ අවධානයට යොමුවිය යුතු කරුණකි. භික්ෂූන් විෂයෙහි පනවන ලද විනය ශික්ෂා දෙස බලා සෞන්දර්යෙහි අංගයක් වන ගීතය හා කවිය බුදුදහමෙන් හෙලා දකින බව ආනන්ද කුමාරස්වාමි ඔහුගේ "ශිව නෘත්‍යය" ග්‍රන්ථයෙහි සඳහන් කොට ඇත. එහෙත් එය වැරදි මතයකි.

ගීතය හා කවිය භික්ෂූන්ට ප්‍රතික්ෂේප කළ අවස්ථා කිහිපයක් ත්‍රිපිටකයේ ඇත. දීඝනිකායේ සීලක්ඛන්ධ වග්ගයේ



සූත්‍රවල මධ්‍යම ශීල යටතේ භික්ෂූන් ඇලුම් නොකළ යුතු තහනම් විෂයක් ලෙස කවි, ගීත දක්වා තිබීම, අංගුත්තර නිකායේ රුණ්ණ සුත්‍රයෙහි ගීතය හැඬීමක් ලෙස දැක්වීම,[11] (රුණ්ණමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ යදිදං ගීතං) උපෝසත අෂ්ටාංග, දශාංග ශීලවලදී ගීතය විරමණය කළයුතු දෙයක් ලෙස දැක්වීම, චුල්ලවග්ග පාළියේ ඛුද්දක වත්ථුක්ඛන්ධකයේ බුද්ධ වචනය ඡන්දසට නොනැගිය යුතු බව දැක්වීම, එහිම ගී හඬින් ධර්මය ගායනා නොකළ යුතු බව දැක්වීම ගීතය හෙලා දැකි අවස්ථා ලෙස ත්‍රිපිටක සාහිත්‍යයෙන් උපුටා දැක්විය හැකිය.[12] එම අවස්ථා භික්ෂූන් විෂයෙහි සිදු කරන ලද පැනවීම් බැවින් කාමභෝගි ගිහියන් විෂයෙහි අදාළ නොවන බව සැලකිය යුතුය.

ගීතය සහ කවිය බුදුන් වහන්සේ විසින් පැසසුමට ලක්කළ අවස්ථා ද ත්‍රිපිටකයේ ඇත. එබඳු අවස්ථා අතර මිහිරි කටහඬින් බණ කීම අනුමත කිරීම. ලකුණ්ටක තිස්ස තෙරුන්ට මිහිරිහඬින් බණ කියන්නන් අතර අගතනතුර පිරිනැමීම. සංයුක්ත නිකායේ සෝණ කොළිවිස සූත්‍රයෙහි සඳහන් පරිදි සෝණ කෝළිවිස හිමියන් බුදුන් වහන්සේ වැඩසිටි ජේතවනාරාමයේ ගඳකිළිය ආසන්නයේ වැඩසිටමින් සුත්ත නිපාතයේ අට්ඨකපාරායන වග්ගයේ ගාථා ඉතා මිහිරි ලෙස ගායනා කළවිට එය අසා බුදුන් වහන්සේ විසින් පැසසුමට ලක්කිරීම. බුදුන් වහන්සේද ගාථාවන්ගෙන් ධර්මය දේශනා කිරීම. පඤ්චසිඛගේ වීණා වාදනය හා ගායනය පැසසුමට ලක්කිරීම. අංගුත්තර නිකායේ කවි සූත්‍රයේ දී චින්තා කවි, සුත කවි, අත්ථ කවි, පටිභාණ කවි, යනු වෙන්

කවියන් හතර දෙනෙකු ඇති බවත් එයින් පටිභාන කවියා ශ්‍රේෂ්ඨ බව දැක්වීම ආදී වූ මෙබඳු අවස්ථාවන්ගෙන් පැහැදිලි වන්නේ රාගික හැඟීමෙන් තොරව කවි ගී මඟින් කරන රස වින්දනය බුද්දහමෙන් ප්‍රතික්ෂේප නොවන බවයි.

## නෘත්‍ය පිළිබඳ බෞද්ධ ආල්පය

"කාව්‍යෙෂු නාටකං රම්‍යං" යනු වෙන් සාහිත්‍ය විචාරකයන් විසින් දක්වා ඇති පරිදි කව්‍ය අතර රමණීයම සාහිත්‍ය විශේෂය වන්නේ නාට්‍යයයි. නාට්‍ය රස වින්දනය සඳහා භාරතීය ජනතාව පුරා අතීතයේ සිට හුරුපුරුදු වී සිටි බව බෝසත් චරිතයෙන් ද උපතිස්ස සහ කෝලිතගේ ගිහි ජීවිතය කළ කිරීමට පත්කරන ලද ගිරග්ගසමජ්ජ නාට්‍ය රඟ දැක්වීමේ පුවතින් ද පැහැදිලිය. බුද්දහම උසස් ශීලයෙහි දී නාට්‍ය විරමනය කළ යුතු විසූක දස්සන ලෙස සහ "උම්මත්තකමිදං අරියස්ස විනයෙ යදිදං නච්චං"[13] යනුවෙන් අංගුත්තරනිකායේ රුණ්ණ සූත්‍රයෙහි අරිය විනයෙහි දී නාට්‍යය උමතුවක් ලෙස ද දක්වා ඇත. එසේම සිඟාලෝවාද සූත්‍රයේ ධනය විනාශ වන මුඛයක් ලෙස නාට්‍ය සඳහා ලොල්වීම සඳහන් ය.[14] හුදු විනෝද මාධ්‍යයක් ලෙස පමණක් අරමුණු කොට උභය ලෝකාර්ථයට හේතු නොවන නාට්‍ය නැරඹීම, රසවින්දය බුද්දහමෙන් ප්‍රතික්ෂේප කොට ඇත. සංස්කෘතික අංගයක් ලෙස ගිහි සමාජයෙහි ඇති නාට්‍ය දර්ශන ගිහියන් විසින් නැරඹීම අර්ථාන්විත ජීවන දර්ශනයක් ලබා ගැනීම මෙන්ම ධාර්මික ලෞකික ප්‍රීති සුවය සඳහා හේතුවේ නම් ඒ පිළිබඳ බුද්දහමේ විරෝධත්වයක් නැත.



"න තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ
සංකප්පරාගො පුරිසස්ස කාමා
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ
අථෙත්ථ ධීරා වපයන්ති ඡන්දං "[15]

බුදුන් වහන්සේ විසින් පිළිතරු වශයෙන් එක්තරා දෙවියෙකුට කළ මෙම ප්‍රකාශයෙන් සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බුද්දහමේ ස්ථාවරය මැනවින් පැහැදිලි වේ. එහි සඳහන් පරිදි නානාවිධ වූ විචිත්‍ර දේවල් ලෝකයේ සැමදා පවතියි. ප්‍රඥාවන්තයෝ එම විචිත්‍රත්වය, විචිත්‍රත්වය ලෙස දැක එහි ඇලීමක් නොවෙති. බුද්දහම සත්ත්වයාට සංසාර විමුක්තිය පිණිස හේතු වන දහමක් දේශනා කළ අතර එහිදී ධාර්මික ලෞකික සතුට ප්‍රතික්ෂේප නොකොට එය ආධ්‍යාත්මික සතුටක් සඳහා පරිවර්තනය කරගැනීමට උපදෙස් බලාදී ඇත. එබැවින් ධාර්මික ලෞකික සතුට පිණිස හේතුවන සෞන්දර්ය රසාස්වාදය බුද්දහමින් ප්‍රතික්ෂේප නොවන බව අපගේ නිගමනයයි.

## ආන්තික සටහන්

1. හිතෝපදේශය (මිත්‍රලාභය), සංස්., සිරිතිලක සිරි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2007, පිටුව 07
2. සිංහල පද්‍ය බන්ධනය, සංස්., ඕවිටිගල වජිරඤාණ හිමි, ඒකනායක මුද්‍රණාලය, වේයන්ගොඩ, 1954, පිටුව 34
3. ඛුද්දක නිකාය 01, (ධම්මපදය, සුඛවග්ගය ), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල,2005, පිටුව 76
4. ''අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං පජානාති'' මජ්ඣිමනිකාය 01 සීහනාදවග්ගය, මහාදුක්ඛක්ඛන්ධ සුත්ත), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පිටුව 214
5. මජ්ඣිමනිකාය 01, (ඔපම්ම වග්ග, අරිය පරියෙසන සුත්ත), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005,පිටුව 406
6. ඛුද්දකනිකාය 01, (ධම්මපදය, අරහන්ත වග්ගය ), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005,පිටුව 46
7. එම, පිටුව 46
8. දීඝ නිකාය 02, (මහාපරිනිබ්බාණ සූත්‍රය), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පිටුව 160
9. ථෙරථෙරී ගාථා පාළි, (දසක නිපාතය, කාළුදායි ථෙරගාථා), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පිටුව 152
10. එම, (චතුක්ක නිපාතය, සප්පක ථෙරගාථා), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පිටුව 100



11. අංගුත්තරනිකාය 01, (තිකනිපාතය, රුණ්ණ සුත්ත), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පිටුව 464
12. '' න භික්ඛවෙ ආයතකෙන ගීතස්සරෙන ධම්මො ගායිතබ්බායො ගායෙය්‍ය ආපත්ති දුක්කටස්සාති'' චුල්ලවග්ගපාලි II, බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පිටුව 12
13. අංගුත්තරනිකාය 01, (තිකනිපාතය, රුණ්ණ සුත්ත), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පිටුව 464
14. '' සමජ්ජාභිචරණං භොගානං අපායමුඛං'' දීඝනිකාය 03, (පාථික වග්ගය, සිඟාලසුත්ත), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පිටුව 292
15. සංයුත්තනිකාය 01, (දේවතා සංයුත්තය, නසන්ති සුත්ත), බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පිටුව 42